*සැ. යු.* - 2011.04.15 වැනි දින පළවූ අංක 1,702 දරන *ගැසට් පත්‍රයේ* I :III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,703 - 2011 අප්‍රේල් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2011.04.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 244 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 245 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 246 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අප්‍රේල් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අප්‍රේල් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


243- B 080217—3,350 (2011/04)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2011 අංක 145

D/AF/824.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස්වීම, විශ්‍රාම ගැනීම සහ නිත්‍ය උපසේවයට බඳවා ගැනීම

2010 ඔක්තෝබර් මස 04 වැනි දින සිට පහත සඳහන් නිලධාරියා තාවකාලික එයාර් වයිස් මාර්ෂල් නිළයට උසස් කරන අතර 2010 ඔක්තෝබර් මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්වා 2010 ඔක්තෝබර් මස 06 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදා නිත්‍ය උපසේවයට බඳවා ගන්නවා ඇත :

එයාර් කොමොඩෝර් තෙන්නකෝන් මුදියන්සේලාගේ ප්‍රකාෂ් දිල්රුක්ෂ තෙන්නකෝන් (01288) - සැපයුම්

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

04-569

---

2011 අංක 146

D/AF/833.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2011 ඔක්තෝබර් මස 03 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

විංග් කමාන්ඩර් හෙන්දුදුර ඩියුක් ද සොයිසා (01801) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

04-570

---

2011 අංක 147

D/AF/834.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2011 ඔක්තෝබර් මස 05 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

විංග් කමාන්ඩර් රාජකරුණා ආරච්චිගේ ප්‍රියන්ත උදයකුමාර ජයවික්‍රම (01617) - විද්‍යුත් ඉංජිනේරු

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

04-571

---

D/AF/832.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නෙරපා හැරීමක්

පහත නම සඳහන් නිලධාරියාව ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් අවඥා සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කොට ඇත :

ෆ්ලයින් ඔෆිසර් උපුල් තුෂාර ගුණරත්න (01767) - නියමු පොදු රාජකාරි - 2010.09.15

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

04-568

# රජයේ නිවේදන

මගේ යොමු අංක : ඊඩී/1/8/2/මාර/65.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6)(අ), (ආ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මාතර දිස්ත්‍රික්කයේ, පාලටුව, මාලිම්බඩ, ඉන්ද්‍රාරාම විහාරස්ථානයේ පිහිටි මාර/ශ්‍රී ප්‍රේමානන්ද මූලික පිරිවෙන 2010.01.04 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය මාලිම්බඩ යසස්සී ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2011 මාර්තු මස 25 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන අධ්‍යාපන ශාඛාවේ දී ය.

04-579/1

මගේ යොමු අංක : ඊඩී/1/8/1/බ/40.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6)(අ), (ආ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, තලාකුඹුර, ගලඋඩ, හාලිඇළ රත්නාලෝක විහාරස්ථානයෙහි පිහිටි බ/ශ්‍රී රත්නාලෝක මූලික පිරිවෙන 2010.01.04 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය උඩගම සීලරතන ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2011 මාර්තු මස 25 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

04-579/2

---

මගේ යොමු අංක : ඊඩී/1/8/1/ර/41.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6)(අ), (ආ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩමුදුන, බුළුතොට සිංහරාජ ප්‍රාන්ත අරණ්‍ය සේනාසනයෙහි පිහිටි ර/ශ්‍රී රෝහණ වනවාස මූලික පිරිවෙන 2010.01.04 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය ගොඩකුඹුරේ ධම්මප්‍රිය ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2011 මාර්තු මස 25 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන අධ්‍යාපන ශාඛාවේ දී ය.

04-579/3

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

බී. එල්. වී. චින්තක.
ගිණුම් අංක : 0025 5002 3663.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් සී. බී. දෙහිගම යන අය විසින් ලියා සහතික කරන ලද 2007 සැප්තැම්බර් මස 25 දාතම හා අංක 33383 දරන සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. වීබැද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2009 මාර්තු මස 25 දාතම හා අංක 1489 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලපිටිය ලියනගේ විපුල් චින්තක යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහඅට ලක්ෂ තිස් හතර දහස් තුන්සිය පනස් දෙකයි ශත අනූ නමයක (රු. 18,34,352.99) මුදලක් 2010 අගෝස්තු මස 03 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහඅට ලක්ෂ තිස් හතර දහස් තුන්සිය පනස් දෙකයි ශත අනූනමයක (රු. 18,34,352.99) මුදල ද 2010 අගෝස්තු මස 04 දින සිට අංක 33383 සහ 1489 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දොලොස් ලක්ෂ තිස් දෙදහස් නමසිය හැට හතයි ශත පනස් දෙකක (රු. 12,32,967.52) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) හා තවත් රුපියල් දෙලක්ෂ හැටපන් දහසක (රු. 2,65,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හයක් (26%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 33383 සහ 1489 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පලාපත්වල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගම්පහසිය පත්තුවේ පලපත්වල කෝන්ගහමුල පිහිටි ඕලිස් කෝන් වත්ත යයි කියනු ලබන ඉඩමට (1996 පෙබරවාරි 25 දාතම හා අංක PP Ma 1203 දරන පිඹුරේ ලොට් 16 වන) බලයලත් මානක තැන ඒ. ජී. ඩබ්ලිව්. ගිරාගම යන අය විසින් සාදන ලද 2000 අප්‍රේල් මස 09 දාතම හා අංක 4858 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : PP Ma 1203/14, නැගෙනහිරට : PP Ma 1203/15, දකුණට : නිවසට සහ ආරක්ෂක තාප්පය දක්වා දිවෙන පාර සහ බස්නාහිරට : PP Ma 1203/6 දරන ඉඩම සහ ආරක්ෂක තාප්පය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම බිංදුවයි හයක් (අ. 0, රූ. 0, පර්. 11.06) හෝ හෙක්ටයාර් 0.028ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4858 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B495/204 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ඉඩම පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ගම්පහසිය පත්තුවේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝන්ගහමුල සහ ගල්වඩුකුඹුර පිහිටි "ඕලිස්කෝම්බේ වත්ත" යයි කියනු ලබන ඉඩමට 1996 පෙබරවාරි මස 25 දාතම හා අංක 1203 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 16 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 14, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 15, දකුණට : මාර්ග පිවිසුම සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 6 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0280ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04-692/4

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

සී. ඒ. ඩී. ජේ. ලසන්ත
ගිණුම් අංක : 1024 5009 6420.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ ජූනි මස 24 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ප්‍රනාන්දුපුල්ලේ යන අය විසින්

ලියා සහතික කරන ලද 2005 ඔක්තෝබර් මස 06 දාතම හා අංක 7204 දරන හා 2007 ජනවාරි මස 26 දාතම හා අංක 9198 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ චිත්‍ර ආරච්චිගේ දොන් ජුඩ් ලසන්ත යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහහතර ලක්ෂ තිස් දහස් පන්සිය හැට නමයයි ශත හැට එකක (රු. 14,30,569.61) මුදලක් 2010 පෙබරවාරි මස 17 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහහතර ලක්ෂ තිස් දහස් පන්සිය හැට නමයයි ශත හැට එකක (රු. 14,30,569.61) මුදල ද 2010 පෙබරවාරි මස 18 දින සිට අංක 7204 සහ 9198 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහතුන් ලක්ෂ දහ නම දහස් හාරසිය පහළොවයි ශත පහළොවක (රු. 13,19,415.15) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහලවක් (15%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 7204 සහ 9198 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ උතුරු පල්ලන්සේන පිහිටි කෝන්ගහවත්තෙන් හතරෙන් එකෙන් හතරෙන් තුනක් වන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් යන අය විසින් සාදන ලද 1989 ඔක්තෝබර් මස 10 දාතම හා අංක 1336B/89 දරන පිඹුරේ බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1336A/89 දරන පිඹුරේ ලොට් 3, නැගෙනහිරට : රගුලස් පෙරේරා යන අයගේ ඉඩම, දකුණට : ජුවන් පෙරේරා යන අයගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් B සහ C යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 14.1) විශාල ඉඩම් කොටස සමග වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්‍රිරුව E621/383 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී උතුරු පල්ලන්සේන පිහිටි කළුමාරත්තදී තෝට්ටම් නොහොත් කෝන්ගහවත්තේ ලොට් 6 වශයෙන් විස්තර කොට ඇති හා බලයලත් මානක තැන ඩබ්ලිව්. ඩී. එච්. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 ඔක්තෝබර් මස 07 දාතම හා අංක 641 දරන පිඹුරට අනුව සීමා නිර්ණය කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 8 සහ 5, නැගෙනහිරට : ලොට් 5, දකුණට : ජුවන් පෙරේරාගේ උරුමක්කාරයින් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : ලොට් 7 සහ 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 14.1) විශාල ඉඩම් කොටස සමග වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සමග ය.

එකී අංක 641 දරන පිඹුරේ ලොට් 8 වශයෙන් ලකුණුකොට ඇති මාර්ග වෙන් කිරීම, භාවිතා කිරීමට, නඩත්තු කිරීමට සහ සංවර්ධනය කිරීමට ඇති අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

04-692/1

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එච්. ටී. සී. ඩබ්ලිව්. විජේසූරිය සහ එච්. කේ. එන්. ද සිල්වා.
ගිණුම් අංකය : 0093 5000 1988.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :-

සමාගම් අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. ආර්. රත්ගම යන අය විසින් ලියා සහතික කරන ලද 2007 මැයි මස 09 දාතම හා අංක 85 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෙට්ටි තන්තිරිගේ චම්ලි වසන්ත විජේසූරිය සහ හෙට්ටි හේවගේ කමනි නිලන්ති ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් නම ලක්ෂ අසූ නම දහස් නමසිය තිස් හතයි ශත තිස් හයක (රු. 9,89,937.36) මුදලක් 2010 සැප්තැම්බර් මස 30 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් නම ලක්ෂ අසූ නම දහස් නමසිය තිස් හතයි ශත තිස් හයක (රු. 9,89,937.36) මුදල ද 2010 ඔක්තෝබර් මස 01 දින සිට අංක 85 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර ලක්ෂ තිස්එක් දහස් දෙසිය හතළිස් එකයි ශත විසිහයක (රු. 4,31,241.26) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) හා තවත් රුපියල් පන් ලක්ෂයක (රු. 5,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 85 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත්

බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාවන් තුළ බදුලුපිටිය ග්‍රාමයේ පිහිටි "නිටොල්කුඹුර" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් මස 14 දාතම හා අංක 5475 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඇල, නැගෙනහිරට : ලොට් 3, දකුණට : බදුලුපිටිය වටරවුම් පාර සහ පැල ඉණි වැට සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.50) විශාල ඉඩම් කොටස (S. P. C. A. රේන්ච් වශයෙන් පොදුවේ හඳුන්වනු ලබන) සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් සහ වරිපනම් අංක 21 දරන ගොඩනැගිල්ල ද සමග එකී අංක 5475 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A102/137 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

04-692/6

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

ආර්. එම්. ෆාහිම් සහ එෆ්. එස්. ෆාහිම් *විවාහයට පෙර* මරික්කාර්.
ගිණුම් අංකය : 1007 5020 4842.

2007 අගෝස්තු මස 30 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කෙන්ගල්ල බලගොල්ල සමර් ෆීල්ඩ් අංක 23 දරන ස්ථානයේ පදිංචි රාසීන් මොහමඩ් ෆාහිම් සහ ෆාතිමා ශිෆානි ෆාහිම් *විවාහයට පෙර* මරික්කාර් යන දෙදෙන බන්ධනදායීන් වශයෙන් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. සුහසිංහ විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2004 මැයි මස 15 දාතම හා අංක 1950 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 මැයි මස 04 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හයලක්ෂ දහසය දහස් හාරසිය අනූවකුත් ශත තිස්පහක (රු. 6,16,490.35ක් පමණයි) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් හයලක්ෂ දහසය දහස් හාරසිය අනූවකුත් ශත තිස්පහක (රු. 6,16,490.35ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් පන්ලක්ෂ හැටතුන් දහස් එකසිය හැට හතකුත් ශත හැත්තෑ හයක (රු. 5,63,167.76ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට පහළොවයි දශම පහ (12.5%) බැගින් 2007 මැයි මස 05 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද, සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අය කර ගැනීම සඳහා එකී අංක 1950 දරන බැඳුම්කරය මගින් සම්පත් බැංකුව පීඑල්සීට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ කෝරළේ, කෙන්ගල්ලේ පිහිටි දැනට සමර්ෆීල්ඩ් නමින් හැඳින්වෙන (බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව විසින් සාදන ලද 1998 මැයි මස 22 වැනි දාතම හා අංක 2280 පිඹුරේ ලොට් 1 සහ ලොට් 2 හි සහ බලයලත් මිනින්දෝරු බී. සමරසිංහ විසින් සාදන ලද 1960 ජනවාරි දාතම හා අංක 474 දරන පිඹුරේ ලොට් 14Aහි එකතුවක උප බෙදුමක් වන) මොරගහපිටිය එස්ටේට් නමැති ඉඩමෙන් බලයත් මිනින්දෝරු එච්. ඩී. පී. ගුණවර්න විසින් සාදන ලද 1998 මැයි මස 30 හා 1998 ඔක්තෝබර් මස 20 දාතම හා අංක 722 දරන පිඹුරේ ලොට් 23 ලෙස ලකුණු කොට නිරූපිත මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව 730/179හි ලියාපදිංචි කර ඇති ඊසාන දෙසින් : කලින් කනවඩිවිල්ලෙයිට අයත් වූ දැනට වෙන්කොට සීමාසහිත කොමර්ෂල් ක්‍රෙඩිට් සමාගම විසින් විකුණනු ලබන ඉඩම ද, ගිණිකොන දෙසින් : එකී පිඹුරේ ලොට් 24 ද, නිරිතදිගින් : බලයලත් මිනින්දෝරු බී. සමරසිංහ විසින් සාදන ලද 1960 ජනවාරි දාතම හා අංක 474 පිඹුරේ ලොට් 13 ද සහ වයඹ දෙසින් : එකී පිඹුරේ ලොට් 21 සහ 22 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.10) හෝ හෙක්ටයාර් 0.02555 වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන් හා ගොඩනැගිලි ද සමග සහ මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමග.

බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව විසින් සාදන ලද අංක 7074 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති පාර සහ බලයලත් මිනින්දෝරු එච්. ඩී. පී. ගුණවර්ධන විසින් සාදන ලද අංක 722 පිඹුරේ පෙන්වා ඇති පාර සහ බලයලත් මිනින්දෝරු බී. සමරසිංහ විසින් සාදන ලද අංක 474 පිඹුරේ ලොට් 13 මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

04-692/3

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ඩබ්ලිව්. කේ. එම්. එස්. බන්දුල.
ගිණුම් අංකය : 0030 5000 1333.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :-

සීමාසහිත සම්පත් බැංකුව නමින් වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා යන අය විසින් ලියා සහතික කරන ලද 1998 දෙසැම්බර් මස 17 දාතම හා අංක 14539 දරන හා 2002 අප්‍රේල් මස 24 දාතම හා අංක 20500 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන්නප්පුව, නැගෙනහිර දුම්මලදෙණිය, "කල්‍යාණි " හි පදිංචි වික්‍රමසිංහ කුරුප්පු මුදියන්සේලාගේ සරත් බන්දුල යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පහලොස් ලක්ෂ පනස් නම දහස් එකසිය හතළිස් හතයි ශත අනූ නමයක (රු. 15,59,147.99) මුදලක් 2005 ජනවාරි මස 19 වැනි දිනට එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පහලොස් ලක්ෂ පනස් නම දහස් එකසිය හතළිස් හතයි ශත අනූ නමයක (රු. 15,59,147.99) මුදල ද 2005 ජනවාරි මස 20 වැනි දින සිට අංක 14539 සහ 20500 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් පනස් හය දහස් හාර සියයක (රු. 56,400) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හතරක් (24%) හා තවත් රුපියල් දහතුන් ලක්ෂ අසූ පන් දහස් දෙසිය දෙකයි ශත පනහක (රු. 13,85,202.50) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 14539 සහ 20500 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, බටහිර දුම්මලදෙණිය පිහිටි "මාදන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. එෆ්. වර්ණකුලසූරිය යන අය විසින් සාදන ලද 1968 මැයි මස 10 දාතම හා අංක 7438 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : හේරත්හාමි සහ මලියරත්න අත්තනායක යන අයගේ උරුමක්කාරයින් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : එම පිඹුරේ ලොට් 02 සහ බස්නාහිරට : මලියරත්න අත්තනායක යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි පහක් (අ. 0, රූ. 0, පර්. 25) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේත් සමග වෙළුම/පත්ඉරුව ජී 74/85 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

04-692/5

---

**සීමාසහිත සම්පත් බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එස්. ජීවරාණි නොහොත් සීවරාණි සහ එල්. සෙල්ලදුරාජ් (වඩාත් නිවැරදිව සෙල්ලදුරෙයි).
ගිණුම් අංකය : 0046 5000 5827.

2007 මාර්තු මස 29 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හපුතලේ සුපර් මාර්කට් සංකීර්ණයේ අංක 4 නිරෝෂා ජුවෙලර්ස්හි සොක්කලිංගම් ජීවරාණි නොහොත් සීවරාණි සහ ලෙච්චුමනන් සෙල්ලදුරාජ් (වඩාත් නිවැරදිව සෙල්ලදුරෙයි) යන දෙදෙන බන්ධනදායීන් වශයෙන් බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 ජනවාරි මස 10 දාතම හා අංක 13697 දරන උකස් බැඳුම්කරය මත උකසට තබන ලද පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන සපයන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 ජනවාරි මස 10 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහඅට ලක්ෂ අසූ දෙදහස් පනස් හතකුත් ශත හතළිස් හතරක් (රු. 18,82,057.44ක් පමණයි) එකී බැඳුම්කර මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දහඅට ලක්ෂ අසූ දෙදහස් පනස් හතකුත් ශත හතළිස් හතරක (රු. 18,82,057.44ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දාහත් ලක්ෂ විසිපන් දහසක (රු. 17,25,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහත (17%) බැගින් 2007 ජනවාරි මස 11 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 13697 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙසේ යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදකිඳ කොට්ඨාසයේ, මහපළාත කෝරළේ, බණ්ඩාරවෙල නගර සභා සීමාව තුළ බණ්ඩාරවෙල නගරයේ, කෙළින් වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ෆුවාඩ් ඉස්මයිල් විසින් සාදන ලද 2004 සැප්තැම්බර් මස 20 දාතම හා අංක 892 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත "ගොඩපතන" සහ "මුලටේකුඹුර" නමැති උතුරට : නිවාසවලට යන (පඩි) පියගැට ද, නැගෙනහිරට : ලොට් අංක 2 ද, දකුණට : කෙළින් වීදිය ද සහ බටහිරට : ශාන්ති ස්ටෝර්ස් ද මායිම් වන බදුල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව J132/261හි ලියාපදිංචි කොට ඇති එකී පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 1.5) වන සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිල්ල සහ අනෙකුත් සියලු දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

04-692/2

---

### කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

සීමාසහිත එස්. එම්. ඉන්ඩස්ට්‍රියල් ලංකා (පුද්ගලික) සමාගම.
සමන් විජේවන්ත පතිනායක.
ගිණුම් අංක : 1104007072
ණය ගිණුම් අංක : 422086, 477730 සහ 477736.

වර්ෂ 2010 ක් වූ ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී :-

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. එස්. එස්. ජයවීර විසින් වර්ෂ 2008ක් වූ ජනවාරි මස 21 වැනි දින සහතික කරන ලද අංක 14249 හා වර්ෂ 2008ක් වූ ඔක්තෝබර් මස 20 වැනි දින සහතික කරන ලද අංක 14394 දරන දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ නීත්‍යානුකූල සමාගමක් ලෙස ස්ථාපිත සමාගමක් වන පුහුල්වෙල, කිරින්ද, දේවානන්ද නා හිමි මාවතේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සීමාසහිත එස්. එම්. ඉන්ඩස්ට්‍රියල් ලංකා (පුද්ගලික) සමාගම බලකරු වශයෙන් හා සමන් විජේවන්ත පතිනායක උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ 2010 මැයි මස 24 වැනි දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත රුපියල් මිලියන නමයක් සහ අටලක්ෂ පහලොස් දහස් අටසිය හතළිස් එකයි ශත අනූ හතරක් (රු. 98,15,841.94) අයවිය යුතු හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන නමයක් සහ අටලක්ෂ පහලොස් දහස් අටසිය හතළිස් එකයි ශත අනූ හතරක් (රු. 98,15,841.94) මුදල හා වර්ෂ 2010ක් වූ මැයි මස 25 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 18,32,036.35ට 22%ක්, රු. 39,23,268.23ට 20%ක්, රු. 4,83,332ට 22% සහ රු. 23,75,500ට 6.5%ක් වශයෙන් වැඩිදුර වාර්ෂික පොළියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබා ගෙන ඇත්තාවූ යම් ගෙවීමක් වෙතොත් ඒවා ද අඩුකොට එකී මුදල් අයකර ගැනීම සඳහා අංක 14249 සහ 14394 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ස්ඩෝර්ෆ් වීදියේ අංක 99 අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරයි.

### උපලේඛනය

බලයලත් මිනින්දෝරු කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්‍රමරත්න විසින් 2007 ජූනි මස 25 වැනි දින මැන සාදන ලද 152 දරන පිඹුරේ ලොට් A හි කොටසක් වන ලොට් A1 වශයෙන් දැක්වෙන දකුණු පළාත මාතර දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුවේ කිරින්ද නම් ගමෙහි පිහිටි නාපගෙහේන නමැති ඉහත කී ලොට් A හි කොටසක් වන ලොට් A1 දරන ඉඩමට මායිම් වශයෙන් උතුරට : මාලපලවවත්ත, නැගෙනහිරට : උඩාබෝගහවත්ත ද, දකුණට : A2 වශයෙන් සලකුණු කොට ඇති අඩි 20ක් පළල පාර සහ බස්නාහිරට : තලවත්ත, වපසරියෙන් රූඩ් දෙකයි පර්චස් පහළොවයි දශම එකක් (අ. 0, රූ. 2, පර්. 15.1) වන ඉඩම.

පහත සඳහන් වෙන් කළ ඉඩම ඔස්සේ ඇති ප්‍රවේශ මාර්ගය හා ඊට අදාළ සියලු හිමිකම් සමග :-

ඉහත සඳහන් කිරින්ද නමැති ගමෙහි පිඹුරු අංක 152හි දැක්වෙන නාපාගෙහේනෙහි ලොට් Aහි ලොට් A2 නමැති ඉඩම් කොටස එහා මෙහා යෑමේ පූර්ණ නිදහස් අයිතිය ඇති උක්ත ලොට් A හි ලොට් A2 ට මායිම් වශයෙන් උතුරට : එම ඉඩමේම ලොට් Aහි ලොට් A1, නැගෙනහිරට : උඩාබෝගහවත්ත සහ බුලත්වැලහේන ද, දකුණට : එම ඉඩමේම ලොට් A හි ලොට් A3 සහ බස්නාහිරට : තලවත්ත, වපසරියෙන් පර්චස් දාසයයි දශම අටක (අ. 0, රූ. 0, පර්. 16.8) ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු 304/271 යටතේ ලියාපදිංචි වී ඇත.

මතු සඳහන් ලොට් A1 සහ A2 පහත විස්තර සඳහන් ඉඩමේ අතුරු බෙදීමක් වේ :-

බලයලත් මිනින්දෝරු කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්‍රමරත්න විසින් 2007 ජූනි මස 30 වැනි දින මැන සාදන ලද අංක 152හි නාපාගෙහේනෙහි ලොට් A1 සහ A2, C304/271 යටතේ ලියාපදිංචි කිරින්දේ පිහිටි නාපාගෙහේන ප්‍රධාන ඉඩම් අතුරු බෙදීමක් වන අතර එම නාපාගේහේනට මායිම් වශයෙන් උතුරට : මාලපලවවත්ත නොහොත් ආචාරිගේ වත්ත සහ බෝගහවත්ත, නැගෙනහිරට : උඩබෝගහවත්ත සහ බුලත්වැලහේන ද, දකුණට : බුලත්වැලහේන සහ බස්නාහිරට : තලවත්ත වශයෙන් අක්කර තුනක (අ. 3, රූ. 0, පර්. 0) වන ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු 304/271 යටතේ ලියාපදිංචි වී ඇත.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

04-664

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

සීමාසහිත ෆොටෝ ෆයින් කලර් ලැබොරටරීස් (පුද්ගලික) සමාගම.
ගිණුම් අංක : 1360000456.
ණය ගිණුම් අංක : 516016, 516021, 192323, 287919 සහ 387972.

වර්ෂ 2010 ක් වූ නොවැම්බර් මස 26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. එන්. ද සිල්වා විසින් වර්ෂ 2004ක් වූ ජනවාරි මස 22 වැනි දින සහතික කරන ලද අංක 2265 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2006 මාර්තු මස 07 වැනි දින සහතික කරන ලද අංක 3164 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ නීත්‍යානුකූල සමාගමක් ලෙස ස්ථාපිත දකුණු කළුතර, ගුඩ්ෂෙඩ් පාරේ, අංක 24ඒ දරන තැන ලියාපදිංචි කාර්යාලය පිහිටි සීමාසහිත ෆොටෝ ෆයින් කලර් ලැබොරටරීස් (පුද්ගලික) නමැති සමාගම ණයකරු වශයෙන් හා අගම්පොඩි නන්දිත කුමාර ද සිල්වා උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ 2010 ඔක්තෝබර් මස 04 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත රුපියල් මිලියන පහළොවක් සහ හාරලක්ෂ හතළිස් අටදහස් තුන්සිය අසූ හතයි ශත අසූවක් (රු. 15,448,387.80) අයවිය යුතු හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන පහළොවක් සහ හාරලක්ෂ හතළිස් අටදහස් තුන්සිය අසූ හතයි ශත අසූව (රු. 15,448,387.80) ක මුදල හා වර්ෂ 2010ක් වූ ඔක්තෝබර් මස 05 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,454,138.47ට 22%ක්, රු. 2,060,000ට 11%ක් සහ රු. 5,563,000ට 9%ක් වශයෙන් වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබා ගෙන ඇත්තාවූ යම් ගෙවීමක් වෙතොත් ඒවා ද අඩුකොට එකී මුදල් අයකර ගැනීම සඳහා අංක 2265 සහ 3164 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ස්ඩෝර්ෆ් වීදියේ අංක 99 අනුශාලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරයි.

**උපලේඛනය**

බලයලත් මිනින්දෝරු එල්. එස්. එන්. ද සිල්වා විසින් 1956 අප්‍රේල් මස 05 වැනි දින වඩාත් නිවැරදිව 1956 අගෝස්තු මස 05 වැනි දින මැන සාදන ලද අංක 104 දරන පිඹුරේ ලොට් 1 සහ 3 වශයෙන් දැක්වෙන බස්නාහිර පළාත, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ කළුතර බැද්ද, කළුතර නගර සභා සීමාව තුළ, කළුතර වේලාපුර පිහිටි දක්ෂින මහා වීදියේ වරිපනම් අංක 852 දරන ස්ථානයේ පිහිටි මහවත්ත නමැති ඉඩම එහි ඇති ගොඩනැගිලි , ගහකොළ, සහ සියලු දේ සමග ඊට මායිම් වශයෙන් උතුරට : මහවත්තේ අනෙක් කොටස, දැන් වෛද්‍ය හියුග් එස්. ගුණවර්ධනට අයත් වෝටර්ස් මීට්, නැගෙනහිරට : කොළඹ - ගාල්ල මහා මාර්ගය සහ එම ඉඩමේම ලොට් 2, දකුණට : එම ඉඩමේම ලොට් 2 සහ ග්‍රෙගරි ආරච්චිට අයත් ගෙවත්ත සහ බස්නාහිරට : දුම්රිය මාර්ගය හා වෙන් කිරීම පිඹුරු අංක 104හි දැක්වෙන පරිදි පර්චස් තිස් පහයි දශම නමයයි තුනක් (අ. 0, රූ. 0, පර්. 35.93) වූ ඉඩම කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 536/206 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත විස්තර කොට ඇති ලොට් 1 සහ 3 වැනි යාබද ඉඩම් හා සම්බන්ධයෙන් මෑතක දී එනම් 1998 ඔක්තෝබර් මස 08 වැනි දින බලයලත් මිනින්දෝරු බී. කේ. පී. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් සාදන ලද අංක 816 දරන පිඹුරක මෙම ඉඩම පහත සඳහන් පරිදි විස්තර කොට ඇත :-

බලයලත් මිනින්දෝරු බී. කේ. පී. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් මෑතක දී සාදන ලද අංක 816 දරන පිඹුරට අනුව මතු සඳහන් කළුතර වේලාපුර දක්ෂින මහා වීදියේ පිහිටි වරිපනම් අංක 326/2 දරන ඉඩම එහි ඇති ගොඩනැගිලි, ගහකොළ හා සියලු දේ සමග හා එහි මායිම් වශයෙන් උතුරට : මහවත්තේ අනෙක් කොටස දැන් වෛද්‍ය හියුග් එස්. ගුණවර්ධනට අයත් වෝටර්ස් මීට්, නැගෙනහිරට : කොළඹ - ගාල්ල මහා මාර්ගය සහ එම ඉඩමේම ලොට් 2 සහ දකුණට : එම ඉඩමේම ලොට් 2 සහ ග්‍රෙගරි ආරච්චිට අයත් ගෙවත්ත සහ බස්නාහිරට : දුම්රිය මාර්ගය සහ වෙන් කිරීම, පිඹුරු අංක 816හි දැක්වෙන පරිදි පර්චස් තිස් පහයි දශම නමයයි තුනක් (අ. 0, රූ. 0, පර්. 35.93) වූ වපසරිය ඇති ඉඩම.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

04-663

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.